# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2391/02 - 2024 ජූලි මස 01 වැනි සඳුදා - 2024.07.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

### 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 7(1)(ඇ) සහ VI වන කොටස සමග කියවිය යුතු 105 වගන්තිය යටතේ සකස් කළ රීති.

**පී. නන්දලාල් වීරසිංහ,**
පාලක මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති.

2024 ජූලි මස 01 වැනි දින.
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ.

### අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම

1. මෙම රීති "2024 අංක 01 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති " යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු අතර මෙම රීති පාර්ලිමේන්තුව විසින් අනුමත කරන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

2. ශ්‍රී ලංකා මහ බැංකුව, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 7(1)(ඇ) සහ VI වන කොටස සමග කියවිය යුතු 105 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කරමින්, අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සහ එකී මුදල් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීමට අදාළ රීති මෙමගින් නිකුත් කරනු ලබයි.

3. සෑම භාණ්ඩ සහ/හෝ සේවා අපනයනකරුවෙකුම;

    (i) අපනයනය කරන ලද සියලු භාණ්ඩ සහ/හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට සපයන ලද සේවාවලට අදාළව අපනයන ඉපැයීම්, අදාළ පරිදි භාණ්ඩ නැව්ගත කරන ලද දිනයේ සිට හෝ සේවාවන් සැපයූ දිනයේ සිට දින එකසිය අසූවක් (180) ඇතුළත අනිවාර්යෙන්ම ශ්‍රී ලංකාව වෙත ගෙන්විය යුතුය.


1A - G 42147 — 24 (2024/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ii) භාණ්ඩ සහ/හෝ සේවා අපනයනය සම්බන්ධයෙන් වන සියලු අපනයන ඉපැයීම් ලද විගස, එකී අපනයන ඉපැයීම් ලැබීම්වලට අදාළ සියලු ලේඛනගත සාක්ෂි, එම මුදල් ලබන්නා වූ ශ්‍රී ලංකාවේ අදාළ බලපත්‍රලාභී බැංකුවට නොපමාව ඉදිරිපත් කළ යුතුය.

4. ඉහත 3 රීතියට අනුව අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගන්නා සෑම භාණ්ඩ අපනයනකරුවෙකුම, ශ්‍රී ලංකාවට ලැබෙන එම ආදායමෙන් පහත සඳහන් **අවසරලත් ගෙවීම්** සඳහා පමණක් භාවිතයෙන් අනතුරුව, ශේෂය එකී ආදායම ලද මාසයද ඇතුළුව ලිත් මාස තුනක් (03) ඉකුත්වීමෙන් පසුව එළැඹෙන මාසයේ දහවන (10) දින හෝ ඊට ප්‍රථම ශ්‍රී ලංකා රුපියල් බවට අනිවාර්යෙන්ම පරිවර්තනය කළ යුතුය.

(i) අපනයන ව්‍යාපාරයට අදාළ ජංගම ගනුදෙනු සඳහා වන ගෙවීම්;

(ii) 2017 අංක 12 දරන විදේශ විනිමය පනත හෝ 1988 අංක 30 දරන බැංකු පනත (සංශෝධිත) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද රෙගුලාසි, නියෝග සහ විධාන ප්‍රකාරව, භාණ්ඩ අපනයනකරුවන් විසින් විදේශ ව්‍යාවහාර මුදලින් ලබා ගන්නා ලද ණය මුදල්, ආපසු ගෙවීමේ වියදම් සහ ණය වාරික ගෙවීම්;

(iii) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ අවසර දී ඇති පරිදි අනේවාසික ආයෝජකයින්ට ප්‍රකාශිත ලාභාංශ ගෙවීම් සහ/හෝ විදේශීය ජාතිකයින් හෝ ද්විත්ව පුරවැසියන් වන ප්‍රවාසික සේවකයින්ට වැටුප් ගෙවීම්;

(iv) අපනයන ව්‍යාපාරයට අදාළ සංචාරක අරමුණු සඳහා විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ආපසු ලබා ගැනීම හෝ අරමුදල් මාරු කිරීම්;

(v) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනය සඳහා, එම ලබන්නා වූ අපනයන ආදායමෙන් ප්‍රතිශතාංක දහයක් (10%), දක්වා සිදු කරන ගෙවීම්; සහ

(vi) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන අනුව නිකුත් කරන ලද විධානයන් යටතේ අවසරලත්, විදේශ මුදලින් ගෙවීම් අවශ්‍යතා ඇති වක්‍ර භාණ්ඩ හා සේවා අපනයනකරුවන්ට සිදු කරන ගෙවීම්.

5. ඉහත 3 වන රීතියට අනුකූල නොවන අපනයනකරුවන් නියාමන ක්‍රියාමාර්ගවලට යටත් විය හැකි අතර ශ්‍රී ලංකාවට එවන ලද අපනයන ඉපැයීම්, වහාම ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කළ යුතුය.

6. ඉහත 4(vi) වන රීතිය ප්‍රකාර ව, අපනයන ඉපැයීමකින් විදේශ මුදලින් ගෙවීම් ලබන සෑම වක්‍ර භාණ්ඩ හා සේවා අපනයනකරුවෙකුම, එසේ ලැබෙන ආදායමෙන්, ඉහත 4(i) සිට (v) වන රීතීන් යටතේ සඳහන් කර ඇති අවසරලත් ගෙවීම් සඳහා පමණක් භාවිතයෙන් අනතුරුව, ශේෂය එකී ආදායම ලද මාසය ද ඇතුළුව ලිත් මාස තුනක් (03) ඉකුත් වීමෙන් පසුව එළැඹෙන මාසයේ දහවන (10) දින හෝ ඊට ප්‍රථම ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කළ යුතු ය.

7. සෑම බලපත්‍රලාභී බැංකුවක් විසින්ම ඉහත 3 වන රීතියෙන් නියම කරන ලද කාලය තුළ අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සහ ඉහත 4 සහ 6 වන රීති වලින් නියම කර ඇති පරිදි එම මුදල් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම අධීක්ෂණය කළ යුතු අතර, ඒ සඳහා අදාළ වන හෝ ඒ හා සම්බන්ධිත අවශ්‍ය සියලු ලිඛිත සාක්ෂි පවත්වාගෙන යා යුතුය.

8. ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නියම කරන පරිදි, බලපත්‍රලාභී බැංකු සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අපනයන ඉපැයීම් අධීක්ෂණ පද්ධතියට ප්‍රවේශවීමට අවසරලත් අපනයනකරුවන් විසින් එකී අපනයන ඉපැයීම් අධීක්ෂණ පද්ධතියට අවශ්‍ය තොරතුරු ලබා දීම සැමවිටම සහතික කළ යුතුය.

9. සෑම බලපත්‍රලාභී බැංකුවක් සහ අපනයනකරුවෙක්/වක්‍ර අපනයනකරුවෙක් විසින් කලින් කලට නියම කරනු ලබන පරිදි වාර්තා සහ/හෝ ප්‍රකාශන, ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය.

10. ඉහත 9 වන රීතිය යටතේ සඳහන් කර ඇති වාර්තා සහ/හෝ ප්‍රකාශනවල නිරවද්‍යතාවය තහවුරු කරගැනීමේ අරමුණින් එම වාර්තා සහ/හෝ ප්‍රකාශන ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරීන් විසින් පරීක්ෂාවට ලක් කළ හැකිය.

11. මෙම රීතින්ට අනුව, භාණ්ඩ සහ/හෝ සේවා අපනයනයේදී ඕනෑම අපනයනකරුවෙක්/වක්‍ර අපනයනකරුවෙක් හෝ බලපත්‍රලාභී බැංකුවක් විසින් මෙකී රීතින් සමග අනුකූල නොවීමට හෝ උල්ලංඝනය කිරීමට විරුද්ධව ක්‍රියාමාර්ග ඇරඹීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂහට අයිතිය ඇත.

12. මෙම රීති බලාත්මක වන දින හෝ ඉන් පසුව අපනයන කරන ලද සියලු සහ සෑම භාණ්ඩයකට සහ/හෝ සේවාවකට සහ මෙම රීතිය බලාත්මක කිරීමට පෙර දිනක අපනයනය කරන ලද එහෙත් භාණ්ඩ නැව්ගත කළ හෝ සේවා සැපයූ දින සිට එකසිය අසූව (180) වැනි දිනය මෙම රීතිය ක්‍රියාත්මක වූ දිනට පසු ඕනෑම දිනයක් වන භාණ්ඩ සහ/හෝ සේවා සඳහා ද මෙම රීති අදාළ වේ.

13. මෙම රීතීන් විචක්ෂණශීලීව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා වරින් වර බලපත්‍රලාභී බැංකු වෙත මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීමට විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂහට බලය ඇත.

14. මේ රීතීවල කාර්යය සඳහා-

"ජංගම ගනුදෙනු" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය.

"අපනයන ඉපැයීම්" යන්නට අපනයන බිල්පත් මිලදී ගැනීම් වලින් ලබන ආදායම (බිල්පත් වට්ටම් කිරීම), නිෂ්පාදකයින්/ සේවා සපයන්නන් විසින් අපනයනය කරන භාණ්ඩ සහ/හෝ සේවා සඳහා දේශීය නියෝජිතයන්/අතරමැදිකරුවන් හරහා ලැබෙන ගෙවීම් සහ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයෙකුට ලබා දෙන වෘත්තීමය, වෘත්තීය හෝ ව්‍යාපාරික සේවා ඇතුළු සේවා සැපයීමෙන් ශ්‍රී ලංකාවේ නේවාසිකයෙකුට විදේශ විනිමයෙන් ලැබෙන ගෙවීම් ද ඇතුළත් වේ.

"අපනයන ඉපැයීම් අධීක්ෂණ පද්ධතිය"යන්නෙන් අදහස් වන්නේ අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම අධීක්ෂණය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද පරිගණකගත පද්ධතියක් වේ.

"බලපත්‍රලාභී බැංකු"යන්නෙන් අදහස් වන්නේ 1988 අංක 30 දරන බැංකු පනත (සංශෝධිත) යටතේ බලපත්‍ර ලබා ඇති වාණිජ බැංකු හෝ විශේෂිත බැංකු වේ.

"සංචාරක අරමුණු සඳහා විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ආපසු ලබා ගැනීම හෝ අරමුදල් මාරු කිරීම" 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 9 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද විධානයන් ප්‍රකාරව විය යුතුය.

15. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද, 2022 අගෝස්තු 12 දිනැති අංක 2292/50 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත් කරන ලද 2022 අංක 2 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීමේ රීති මගින් සංශෝධිත 2022 මාර්තු 11 දිනැති, අංක 2270/66 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත් කරන ලද, 2022 අංක 1 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීමේ රීති, යන රීති, ඒ යටතේ සිදු කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි, මෙයින් අවලංගු කෙරෙයි.

EOH 07 - 0011

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.